405


අධිකරණ, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා,පළාත් පාලන සහ කම්කරු අමාත්‍යාංශය

நீதி, பொது நிர்வாகம், உள்நாட்டலுவல்கள், மாகாண சபைகள், உள்ளூராட்சி மற்றும் தொழில் அமைச்சு

Ministry of Justice, Public Administration, Home Affairs, Provincial Councils, Local Government and Labour

**කම්කරු අංශය**

தொழில் பிரிவு

**Labour Division**

හයවන මහල, "මෙහෙවර පියස", නාරාහේන්පිට, කොළඹ 05, ශ්‍රී ලංකාව.

6 ஆவது தளம், "மெஹெவர பியெச", நாரஹேன்பிட்டி, கொழும்பு 05, இலங்கை.

6th Floor, " Mehewara Piyesa", Narahenpita, Colombo 05, Sri Lanka.


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය / எனது இல / My No. | ML/ES/06/11/05 | ඔබේ අංකය / உமது இல / Your No. | | දිනය / திகதி / Date | 2024.11.06 |

Department of Manpower & Employment
ADM 10
08 NOV 2024
Administration Division

කම්කරු කොමසාරිස් ජනරාල්, කම්කරු දෙපාර්තමේන්තුව
අධ්‍යක්ෂ ජනරාල්, මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව
අධ්‍යක්ෂ, ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය

**රාජ්‍ය අංශයේ මානව සම්පතෙහි දැනුම වර්ධනය කිරීම උදෙසා මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ දිස්ත්‍රික් මට්ටමින් පවත්වනු ලබන පුහුණු වැඩසටහන - අදියර 04 (සිංහල මාධ්‍ය) ( මහනුවර, මාතලේ, නුවරඑළිය, ගාල්ල, මාතර, හම්බන්තොට, කෑගල්ල, රත්නපුර, ත්‍රිකුණාමලය, මඩකලපුව, අම්පාර, යාපනය, කිලිනොච්චි, මන්නාරම, මුලතිව් හා වව්නියාව දිස්ත්‍රික්කය)**

උක්ත කරුණ සම්බන්ධයෙන් මා ඇමතූ අධිකරණ, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා, පළාත් පාලන සහ කම්කරු අමාත්‍යාංශයේ රාජ්‍ය පරිපාලන අංශයේ අංක MPA/HRD/HR02/01/Dist.Traning/2024 හා 2024.10.30 දිනැති ලිපිය හා බැඳේ (පිටපත අමුණා ඇත).

02 ඔබ දෙපාර්තමේන්තුවේ/ ආයතනයේ සේවයේ නියුතු සංවර්ධන නිලධාරී සේවයේ සහ කළමනාකරණ සේවා නිලධාරී සේවයේ නිලධාරීන් ඉලක්ක කර ගනිමින් මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ දිස්ත්‍රික් මට්ටමින් පුහුණු වැඩසටහන් මාලාවක් පැවැත්වීමට කටයුතු සංවිධානය කර ඇති අතර ඉහත දාතමයේ සඳහන් දිස්ත්‍රික්ක වලට අයත් ඔබ ආයතනයේ අනුයුක්තව සේවයේ නියුතු නිලධාරීන් සඳහා 2024 නොවැම්බර් මස පුහුණු වැඩසටහන් ආරම්භ කිරීමට නියමිත බව මා වෙත දන්වා ඇත.

03. ඒ අනුව, එම ලිපියේ සඳහන් 03 සහ 04 වන ඡේදයන් කෙරෙහි අවධානය යොමු කර ඔබ ආයතනයේ නිලධාරීන් මෙ සම්බන්ධයෙන් දැනුම්වත් කරන ලෙස කාරුණිකව දන්වා සිටිමි.

web site & w/A group
11/12

පී ඩී චන්දන පතිරගේ
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (පාලන)
ලේකම් වෙනුවට

දුරකතන අංකය : 0112 368304
ෆැක්ස් අංකය : 0112 368200
විද්‍යුත් ලිපිනය : sas.admin@labourmin.gov.lk

පිටපත: අතිරේක ලේකම් (පාලන), විදේශ රැකියා අංශය - අවශ්‍ය කටයුතු සඳහා

| | |
|---|---|
| **From** | HRD Public Admin Branch<br>hrdpubadgovlk@gmail.com |
| **Subject** | District Training - Online Session (Step 040 - Sinhala Medium |
| **Date** | Wed, 30 Oct, 24 2:13:06PM |
| **To** | info@mot.gov.lk |

MINISTRY OF LABOUR
30 OCT 2024
Time:..............
SECRETARY'S OFFICE

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන් / දෙපාර්තමේන්තු ප්‍රධානීන්
දිස්ත්‍රික් ලේකම්වරුන්
පළාත් ලේකම්වරුන්

රාජ්‍ය අංශයේ මානව සම්පතෙහි දැනුම වර්ධනය කිරීම උදෙසා මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ දිස්ත්‍රික් මට්ටමින් පවත්වනු ලබන පුහුණු වැඩසටහන - අදියර 04 (මහනුවර ,මාතලේ, නුවරඑළිය , ගාල්ල,මාතර, හම්බන්තොට ,කෑගල්ල, රත්නපුර,ත්‍රිකුණාමලය, මඩකලපුව, අම්පාර ,යාපනය, කිලිනොච්චි, මන්නාරම, මුලතිව් හා වව්නියාව දිස්ත්‍රික්ක)

04 NOV 2024

උක්ත කරුණ පිළිබඳ පුහුණු වැඩසටහනෙහි 04 වන අදියර මහ මැතිවරණයෙන් පසුව ආරම්භ කිරීමට සැලසුම් කර ඇත. ඒ පිළිබඳ විස්තර ඇතුළත් ලිපියෙහි පිටපතක් මේ සමඟ අමුණා ඇත.

මේ පිළිබඳ ඔබ දක්වන සහයෝගය ඉතා අගය කොට සලකමි.

--
Thank You
P. S. P. Weerasinghe
HR 02
Subject Officer
HRD Division

Ministry of Public Administration, Home Affairs, Provincial Councils and Local Government.

04 NOV 2024

--
This message has been scanned for viruses and dangerous content by MailScanner at SLTiDC, and is believed to be clean.

:මාර්ගගත පුහුණු වැඩසටහන අදියර 04 (සිංහල මාධ්‍යය).pdf (558K)

AO
F.N.9
① @ speak pls
11/04

ML10/30

අධිකරණ, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා, පළාත් පාලන සහ කම්කරු අමාත්‍යාංශය
நீதி, பொது நிருவாக, உள்நாட்டலுவல்கள், மாகாண சபைகள், உள்ளூராட்சி மற்றும் தொழில் அமைச்சு
Ministry of Justice, Public Administration, Home Affairs, Provincial Councils, Local Government and Labour
රාජ්‍ය පරිපාලන අංශය
பொது நிருவாகப் பிரிவு
Public Administration Division

නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකාව.
சுதந்திர சதுக்கம், கொழும்பு 07, இலங்கை.
Independence Square, Colombo 07, Sri Lanka.

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය / எனது இல / My No | MPA/HRD/HR02/01/Dist.Training/2024 | ඔබේ අංකය / உமது இல / Your No | | දිනය / திகதி / Date | 2024.10.30 |

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන් / දෙපාර්තමේන්තු ප්‍රධානීන්
පළාත් ලේකම්වරුන්
දිස්ත්‍රික් ලේකම්වරුන්

**<u>රාජ්‍ය අංශයේ මානව සම්පතෙහි දැනුම වර්ධනය කිරීම උදෙසා මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ දිස්ත්‍රික් මට්ටමින් පවත්වනු ලබන පුහුණු වැඩසටහන - අදියර 04 (සිංහල මාධ්‍යය)</u>(මහනුවර ,මාතලේ, නුවරඑළිය , ගාල්ල,මාතර, හම්බන්තොට ,කෑගල්ල, රත්නපුර,ත්‍රිකුණාමලය, මඩකලපුව, අම්පාර ,යාපනය, කිලිනොච්චි, මන්නාරම, මුලතිව් හා වව්නියාව දිස්ත්‍රික්ක)**

ශ්‍රී ලංකාවේ රාජ්‍ය සේවය තුළ කේන්ද්‍ර වී පවත්නා මානව සම්පත රටේ සංවර්ධනය සඳහා වඩාත් කාර්යක්ෂම හා සඵලදායී ලෙස යොදා ගැනීම පිණිස රාජ්‍ය අංශය සතු මානව සම්පත සැලසුම්සහගතව සංවර්ධනය කිරීම අනිවාර්ය අවශ්‍යතාවයක් වේ. ඒ සඳහා මෙම අමාත්‍යාංශයේ මානව සම්පත් සංවර්ධන අංශය විසින් විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි.

02. එම වැඩපිළිවෙල යටතේ සංවර්ධන නිලධාරීන් සහ කළමනාකරණ සේවා නිලධාරී සේවයේ නිලධාරීන් ඉලක්ක කර ගනිමින් මාර්ගගත ක්‍රමවේදය (MS Teams) ඔස්සේ දිස්ත්‍රික් මට්ටමින් පුහුණු වැඩසටහන් මාලාවක් පැවැත්වීමට කටයුතු සංවිධානය කර ඇත. එහි හතරවන වන අදියර මහනුවර ,මාතලේ, නුවරඑළිය , ගාල්ල,මාතර,හම්බන්තොට ,කෑගල්ල, රත්නපුර,ත්‍රිකුණාමලය, මඩකලපුව, අම්පාර ,යාපනය, කිලිනොච්චි, මන්නාරම, මුලතිව් හා වව්නියාව යන දිස්ත්‍රික්කවල පිහිටි රාජ්‍ය ආයතනවල සේවයේ නියුතු නිලධාරීන් වෙනුවෙන් 2024 නොවැම්බර් මස ආරම්භ කිරීමට නියමිත අතර එහි වැඩසටහන් සැලැස්ම පහත පරිදි වේ.

| අනු අංකය | පුහුණු වැඩසටහන | පුහුණු වැඩසටහන පැවැත්වීමට අපේක්ෂිත කාල සීමාව |
|---|---|---|
| 1. | විශ්‍රාම වැටුප් සහ වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ | පැය 03 |
| 2. | බැංකු සැසඳුම් ප්‍රකාශය සහ මාසික ගිණුම් සාරාංශය | පැය 03 |
| 3. | භාණ්ඩ සමීක්ෂණය | පැය 03 |
| 4. | ප්‍රසම්පාදන ක්‍රියාවලිය | පැය 03 |
| 5. | මූල්‍ය බලතල බෙදාදීම, රාජ්‍ය නිලධාරීන්ගේ වගකීම සහ රාජ්‍ය නිලධාරියකු විසින් පවත්වා ගත යුතු පොත් වර්ග | පැය 03 |
| 6. | මූලික විමර්ශන පිළිබඳ දැනුම | පැය 03 |
| 7. | රාජ්‍ය මූල්‍ය කළමනාකරණය පිළිබඳ විගණකාධිපති කාර්යභාර්ය | පැය 03 |
| 8. | රජයේ නිලධාරීන්ගේ ආකල්ප සංවර්ධනය, යහපත් මහජන සම්බන්ධතා සහ සේවාලාභී සත්කාරය | පැය 03 |
| 9. | රාජ්‍ය සේවයට බඳවා ගැනීම, රඳවා ගැනීම හා සේවයෙන් විශ්‍රාම ගැන්වීම | පැය 03 |
| 10. | අල්ලස හා දූෂණය පිටු දැකීම | පැය 03 |

දුරකථන / தொலைபேசி / Telephone: 011-2696211-13, 011-2166000
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2695279
ඊ-මේල් / மின்னஞ்சல் / E-mail: information@pubad.gov.lk
වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.pubad.gov.lk

03. මෙම පුහුණු වැඩසටහනට නිලධාරීන් ලියාපදිංචි කර ගැනීම සඳහා ඔබ අමාත්‍යාංශය/ දිස්ත්‍රික් ලේකම් කාර්යාල/ පළාත් සභා යටතේ ඇති සියලුම දෙපාර්තමේන්තු හෝ ආයතනවල සේවයේ නියුතු, උක්ත පුහුණු වැඩසටහනට සහභාගී වීමට කැමැත්තක් දක්වන නිලධාරීන් පහත ගූගල් සබැඳිය (Google Form) මඟින් හෝ QR කේතය (QR Code) මඟින් **2024.10.13** දිනට පෙර මේ සඳහා ලියාපදිංචි වීමට දැනුම්වත් කරන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි. **(සිංහල මාධ්‍යයෙන් පුහුණු වැඩසටහන සඳහා සහභාගී වන නිලධාරීන් පමණක් ලියාපදිංචි වන මෙන් තවදුරටත් දන්වා සිටිමි)**

**Google Form Link :**

**https://docs.google.com/forms/d/e/1FAIpQLSdA5IiakCP0EoDBZdwAttdoQbBmO6VOlmPQHvrow1iD0iGMlQ/viewform?usp=sf_link**

**Shorten Link : https://forms.gle/weiua85jyyZqLMJM6**

**QR Code:**

04. එමෙන්ම මෙම පුහුණු වැඩසටහන සඳහා ලියාපදිංචි වීමේ දිගුව අප අමාත්‍යාංශ නිල මුහුණු පොතෙහි (Official Facebook Page) – **Ministry of Justice, Public Administration, Home Affairs, Provincial Councils, Local Government and Labour** හි ද සඳහන් වේ. සහභාගීවන නිලධාරීන් හට ඉහත ගූගල් සබැඳිය හෝ QR කේතය (QR Code) ඔස්සේ තමා විසින්ම අයදුම් කිරීම සිදු කළ හැකිය. පුහුණු වැඩසටහන පැවැත්වෙන දිනයන් හා වේලාවන් පිළිබඳව එසේ ලියාපදිංචි වන නිලධාරීන්හට ඔවුන් විසින් ලබා දෙන විද්‍යුත් තැපැල හරහා ඉදිරියේදී දැනුම්වත් කිරීමට කටයුතු කරනු ලැබේ.

05. මෙය මුදල් අයකිරීමකින් තොරව පැවැත්වෙන වැඩසටහනකි. මේ සම්බන්ධයෙන් වැඩිදුර තොරතුරු අවශ්‍යවන්නේ නම් **මානව සම්පත් සංවර්ධන අංශයේ විෂය සම්බන්ධීකාරක පී.එස්.ප්‍රියදර්ශයනී මිය, දුරකථන අංක 011-2698464 හරහා සම්බන්ධ කර ගත හැකි වේ.**

06. රාජ්‍ය සේවයේ මානව සම්පත් සංවර්ධනය උදෙසා වන මෙම ප්‍රයත්නයට ඔබ දක්වන සහයෝගය ඉතා අගය කොට සලකමි.

**එස්.ජලදීපන්**
අතිරේක ලේකම් (මානව සම්පත් සංවර්ධන)
අධිකරණ, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා
පළාත් පාලන සහ කම්කරු අමාත්‍යාංශ ලේකම් වෙනුවට

දුරකතන අංකය: 0112698464
විද්‍යුත් ලිපිනය : hrdpubadgovlk@gmail.com